31086



සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

**සාමාන්‍ය පොදු පරීක්ෂණය**
பொதுச் சாதாரணப் பரீட்சை
Common General Test

**12 S**

*පැය දෙකයි*
*இரண்டு மணித்தியாலம்*
*Two hours*

**උපදෙස්:**
- ✳ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✳ **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**
- ✳ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ✳ උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිලිමත්ව කියවා පිළිපදින්න.
- ✳ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන** පිළිතුර තෝරා ගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** පහළොස් වසරකට පසු ශ්‍රී ලංකාව සමග නිෂ්පාදන අපනයන, සංචාරක සහ තාක්ෂණික සබඳතා දිරිගැන්වීම සඳහා 2026 මැයි මාසයේදී ශ්‍රී ලංකාවට පැමිණියේ කුමන රටෙහි ජනාධිපතිවරයා ද?
(1) මාලදිවයින (2) ඉරානය (3) ජපානය (4) වියට්නාමය (5) ඉන්දියාව

**2.** ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ (EDB) දත්ත අනුව 2025 වර්ෂයේ මෙරටට වැඩිම අපනයන ආදායම් එකතුව ලැබුණු ක්ෂේත්‍රය කුමක් ද?
(1) තේ
(2) පොල් ආශ්‍රිත නිෂ්පාදන
(3) ඇඟලුම් හා රෙදිපිළි
(4) කුළු බඩු සහ සගන්ධ තෙල්
(5) දියමන්ති, මැණික් හා ස්වර්ණාභරණ

**3.** ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් නිල වශයෙන් නිකුත් කළ ආසන්නතම නිවාස හා ජන සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ වැඩිම ජනගහනයක් සිටින දිස්ත්‍රික්කය වන්නේ,
(1) කොළඹ ය. (2) ගම්පහ ය. (3) කුරුණෑගල ය. (4) මහනුවර ය. (5) කළුතර ය.

**4.** 2026 වර්ෂයේදී හොඳම චිත්‍රපටයට හිමි ඔස්කාර් සම්මානය දිනාගත් චිත්‍රපටය කුමක් ද?
(1) One Battle After Another
(2) The Secret Agent
(3) Bugonia
(4) Frankenstein
(5) Sentimental Value

**5.** 2026 ජුනි මාසයේදී තම ඉසව්වෙහි ශ්‍රේණිගත කිරීම්වලින් ලෝකයේ දෙවන ස්ථානයට පත්ව ශ්‍රී ලංකාවට ඉමහත් කීර්තියක් අත්කර දීමට රුමේෂ් තරංග සමත් විය. ඔහුගේ ක්‍රීඩා ඉසව්ව කුමක් ද?
(1) හෙල්ල විසිකිරීම
(2) කවපෙත්ත විසිකිරීම
(3) යගුලිය දැමීම
(4) උස පැනීම
(5) රිටි පැනීම

**6.** 2026 පෙබරවාරි 04 දින සමරන ලද ශ්‍රී ලංකාවේ 78 වන ජාතික නිදහස් දින උත්සවයෙහි තේමාව වූයේ කුමක් ද?
(1) Let's Build a New Country - අළුත් රටක් බිහි කරමු
(2) Towards a National Renaissance - ජාතික පුනරුදයක් උදෙසා
(3) Rebuilding Sri Lanka - ශ්‍රී ලංකාව නැවත ගොඩනගමු
(4) A Step Towards a Flourishing Country - සමෘද්ධිමත් රටක් වෙනුවෙන් පියවරක්
(5) Secure Nation - A Prosperous Country - ආරක්ෂිත ජාතියක් - සමෘද්ධිමත් රටක්

**7.** ලෝකයේ දෛනික බනිජ තෙල් ප්‍රවාහනයෙන් 20% ක් පමණ හෝමූස් සමුද්‍ර සන්ධිය හරහා සිදුවන බැවින් මෙය පෘථිවියේ උපායමාර්ගිකව වඩාත් ම වැදගත්වන සමුද්‍ර සන්ධියක් ලෙස සැලකේ. හෝමූස් සමුද්‍ර සන්ධිය පිහිටා ඇත්තේ කුමන රටවල් දෙක අතර ද?
(1) ඉරානය සහ ඊශ්‍රායලය
(2) ඕමානය සහ ඉරානය
(3) ඕමානය සහ පකිස්ථානය
(4) ඉරානය සහ කුවේටය
(5) ඉරානය සහ පකිස්ථානය

**8.** පුළුල් පර්යේෂණ හා නවීනතම තාක්ෂණය භාවිතයෙන් 'එන්ටෙරොමික්ස්' යන mRNA පිළිකා එන්නත වැඩිදියුණු කර ඇත. මෙම එන්නත පිළිකා ප්‍රතිකාර සඳහා පරිවර්තනීය වෙනසක් සිදුකරනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම එන්නත වැඩි දියුණු කරන ලද රට කුමක් ද?
(1) චීනය (2) ජර්මනිය (3) ඔස්ට්‍රේලියාව (4) ජපානය (5) රුසියාව

[දෙවැනි පිටුව බලන්න.

Past Papers Wiki



**9.** 2026 වර්ෂයේ පැවැත්වූ FIFA ලෝක කුසලාන පාපන්දු තරගාවලියේ ශූරතාව දිනාගත් රට කුමක් ද?
(1) එංගලන්තය (2) ප්‍රංශය (3) ස්පාඤ්ඤය (4) නෝර්වේ (5) ආර්ජන්ටිනාව

**10.** 2025 වර්ෂයේ ලෝක පරිසර දිනයේ විශ්ව තේමාව වූයේ කුමක් ද?
(1) For Life on Earth - පෘථිවිය මත ජීවය සඳහා
(2) Ecosystem Restoration - පරිසර පද්ධති ප්‍රතිස්ථාපනය
(3) Protection of Wetlands - තෙත් බිම් සුරකිමු
(4) Beat Plastic Pollution - ප්ලාස්ටික් දූෂණය පරදවමු
(5) Time for Nature - සොබාදහම සඳහා කාලය

● අංක **11** සහ **12** ප්‍රශ්න, පවුල් දෙකක සාමාජිකයින් පිළිබඳ පහත සඳහන් තොරතුරු මත පදනම් වේ. මෙම සාමාජිකයින්ගේ අදාළ ඥාතිත්ව පහත වගුවෙහි දැක්වේ.

| පවුලේ සාමාජිකයා | ස්ත්‍රී/පුරුෂ භාවය | කලත්‍රයා (විවාහක නම්) | සහෝදරයා/යන් | සහෝදරිය/යන් |
|---|---|---|---|---|
| A | පිරිමි | B | E, H | F, G |
| B | ගැහැනු | A | C | D |
| C | පිරිමි | G | නැත | B, D |
| D | ගැහැනු | නොයෙදේ | C | B |
| E | පිරිමි | නොයෙදේ | A, H | F, G |
| F | ගැහැනු | නොයෙදේ | A, E, H | G |
| G | ගැහැනු | C | A, E, H | F |
| H | පිරිමි | නොයෙදේ | A, E | F, G |

පහත දැක්වෙන අර්ථ දැක්වීම් **පමණක්** භාවිත කරන්න.
* යම් අයකුගේ කලත්‍රයාගේ සහෝදරයන් ඔහුගේ/ඇයගේ මස්සිනාලා ලෙස හැඳින්වේ.
* යම් අයකුගේ සහෝදරියන්ගේ කලත්‍රයන් ඔහුගේ/ඇයගේ මස්සිනාලා ලෙස හැඳින්වේ.
* යම් අයකුගේ කලත්‍රයාගේ සහෝදරියන් ඔහුගේ/ඇයගේ නෑනලා ලෙස හැඳින්වේ.
* යම් අයකුගේ සහෝදරයන්ගේ කලත්‍රයන් ඔහුගේ/ඇයගේ නෑනලා ලෙස හැඳින්වේ.

**11.** A ට සිටින මස්සිනාලා සංඛ්‍යාව සහ නෑනලා සංඛ්‍යාව පිළිවෙළින්,
(1) 1 සහ 1 වේ. (2) 1 සහ 2 වේ. (3) 1 සහ 3 වේ. (4) 2 සහ 1 වේ. (5) 2 සහ 2 වේ.

**12.** G ට සිටින මස්සිනාලා සංඛ්‍යාව සහ නෑනලා සංඛ්‍යාව පිළිවෙළින්,
(1) 0 සහ 1 වේ. (2) 0 සහ 2 වේ. (3) 1 සහ 1 වේ. (4) 1 සහ 2 වේ. (5) 2 සහ 2 වේ.

**13.** නිව්ටන්ගේ සහෝදරිය වන ක්ලේරා නිව්ටන්ට වඩා අවුරුදු හතරක් බාලය. ක්ලේරාගේ දියණිය වන රීටා උපන්නේ ක්ලේරාගේ වයස අවුරුදු 25 දී ය. 2026 දී රීටාගේ වයස අවුරුදු 22 නම් නිව්ටන් උපන්නේ කුමන වර්ෂයේ දී ද?
(1) 1970 (2) 1973 (3) 1975 (4) 1981 (5) 1985

**14.** P නගරයේ බස්නැවතුම්පොළෙන් පෙ.ව. 7.00 ට ගමන් ආරම්භ කරන දුර ගමන් සේවා බස්රථයක් පැයට කිලෝමීටර 60 ක මධ්‍යක වේගයෙන් P නගරයේ සිට 50 km දුරින් පිහිටි පළමු නැවතුම වන Q නගරය තෙක් ධාවනය වේ. ඉහත බස්රථය Q නැවතුම්පොළෙන් ලබා ගැනීමේ අරමුණින් පියෙක් සිය දියණිය සමග යතුරු පැදියෙන් ගමන් කරයි. ඔවුන්ගේ නිවස Q සිට 15 km ක් දුරින් පිහිටා ඇති අතර ඔහු තම යතුරු පැදිය පැයට කිලෝමීටර 45 ක මධ්‍යක වේගයෙන් ධාවනය කරයි. බස්රථය Q වෙත ළඟාවීමට මිනිත්තු 15 කට පෙර Q වෙත ප්‍රවේශවීමට ඔහු අපේක්ෂා කරන්නේ නම් ඔහු නිවසින් පිටත්විය යුතු වේලාව කුමක් ද?
(1) පෙ.ව. 7.10 (2) පෙ.ව. 7.15 (3) පෙ.ව. 7.25 (4) පෙ.ව. 7.40 (5) පෙ.ව. 7.50

**15.** රූපයේ දැක්වෙන පරිදි ගොඩනැගිල්ලක ඍජුකෝණාස්‍රාකාර වහලයක් 40 cm × 20 cm වන සෙවිලි ටයිල් පැනලි සහ එහි මධ්‍යයේ පිහිටි පැත්තක දිග 4 m වූ විනිවිද පෙනෙන (ආලෝකය ලබා ගැනීම සඳහා වන) ප්ලාස්ටික් තහඩුවක් මගින් නිම කර ඇත. සෙවිලි ටයිල් පැනලයක මිල රු. 320 ක් සහ ප්ලාස්ටික් තහඩුවේ වර්ග මීටරයක මිල රු. 1 500 ක් වේ. සෙවිලි ටයිල් පැනලි සහ ප්ලාස්ටික් තහඩුව සඳහා වැයවන මුළු මුදල රුපියල් කීයද?




(1) 240 000 (2) 704 000 (3) 728 000 (4) 768 000 (5) 792 000

**16.** පවුල් සෞඛ්‍ය රක්ෂණාවරණ පැකේජයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.
ප්‍රතිලාභ ලැබීම සඳහා වයස අවුරුදු 16 ට අඩු දරුවන් තිදෙනකුට සහ දෙමාපියන් දෙදෙනාට වාර්ෂික රක්ෂණ වාරිකය රු. මිලියන 0.5 ක් වන අතර වයස අවුරුදු 16 ට අඩු අමතර සෑම දරුවකුටම රු. 100 000 බැගින් ද ගෙවිය යුතු වේ.
වයස අවුරුදු 3, 7, 10 සහ 13 වන දරුවන් හතරදෙනකු සහ දෙමාපිය දෙදෙනා සහිත පවුලක වාර්ෂික රක්ෂණ වාරිකය රුපියල් මිලියන කීය ද?
(1) 0.51 (2) 0.55 (3) 0.56 (4) 0.60 (5) 0.65

● අංක **17** සහ **18** ප්‍රශ්න, පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

එක්තරා දිනක තොග වෙළෙන්දකු සතුව වගුවෙහි දැක්වෙන පරිදි එළවළු තොග පවතී.
මෙම තොගය විකිණීම සඳහා වෙළෙන්දාට ක්‍රම දෙකක් තිබේ.
(a) සම්පූර්ණ තොගයම 16% වට්ටමක් සහිතව එවලේම විකිණීම
(b) සියලුම එළවළු දින දෙකක් තුළ ආරම්භක මිල ගණන් යටතේ සිල්ලරට විකිණීම

| එළවළු | තොගය (kg) | 1kg ක ආරම්භක මිල (රු.) |
|---|---|---|
| බීට් | 900 | 120 |
| නෝකෝල් | 600 | 105 |
| රාබු | 800 | 95 |
| කැරට් | 700 | 160 |

**17.** (a) ක්‍රමයට එළවළු තොගය විකිණීමෙන් වෙළෙන්දාට ලැබෙන මුළු ආදායම කොපමණ ද?
(1) රු. 290 450 (2) රු. 300 500 (3) රු. 301 560 (4) රු. 307 560 (5) රු. 359 000

**18.** (b) ක්‍රමයට එළවළු තොගය විකිණීමෙන් වෙළෙන්දාට ලැබෙන ආදායම (a) ක්‍රමයට එළවළු තොගය විකිණීමෙන් ඔහුට ලැබෙන ආදායමට වඩා කොපමණ වැඩි ද?
(1) රු. 54 712 (2) රු. 56 512 (3) රු. 57 000 (4) රු. 57 440 (5) රු. 60 000

**19.** ප්‍රනාන්දු මහතා වර්ෂ තුනක් සඳහා රු. මිලියන 10 ක මුදලක් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කරයි. ඔහුට පහත දැක්වෙන ආකාර දෙක අනුව පොලී අනුපාත තෝරා ගත හැකිය.
* කල්පිරීමේදී 13% වාර්ෂික පොලී අනුපාතයක් (වාර්ෂිකව පොලිය එකතු කෙරේ) ලැබෙන පරිදි
* 12% වාර්ෂික පොලී අනුපාතය යටතේ මාසික පොලිය ලැබෙන පරිදි

ඉහත ආකාර දෙක අනුව වර්ෂ තුන සඳහා ලැබෙන පොලී ආදායම්වල වෙනස කීය ද?
(1) රු. 700 000 (2) රු. 750 000 (3) රු. 778 000 (4) රු. 818 970 (5) රු. 828 970

**20.** අන්නාසි රසැති අයිස්ක්‍රීම් වර්ගයක ඇති ශුද්ධ අයිස්ක්‍රීම් සහ අන්නාසි අතර බර අනුව අනුපාතය 4:1 වේ. ශුද්ධ අයිස්ක්‍රීම් කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය රු. 750 ක් සහ අන්නාසි කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය රු. 600 ක් නම් අන්නාසි රසැති අයිස්ක්‍රීම් ග්‍රෑම් 500 ක නිෂ්පාදන පිරිවැය කොපමණ ද?
(1) රු. 360 (2) රු. 380 (3) රු. 400 (4) රු. 420 (5) රු. 450

**21.** එක්තරා පවුලක පියෙක් තම දියණියට රු. මිලියන 8 ක් වටිනා ඉඩමක් ද තම පුත්‍රයාට රු. මිලියන 11 ක් වටිනා නිවසක් ද ලබා දෙයි. මව තම දියණියට රු. මිලියන 6 ක් වටිනා ස්වර්ණාභරණ ද තම පුත්‍රයාට රු. මිලියන 5 ක් වටිනා මෝටර් රථයක් ද ලබා දෙයි. පුත්‍රයාට සහ දියණියට ලැබුණු වත්කම්වල වටිනාකම් අතර අනුපාතය කොපමණ ද?
(1) 3 : 1 (2) 4 : 1 (3) 5 : 7 (4) 7 : 8 (5) 8 : 7

● අංක **22** සිට **24** තෙක් ප්‍රශ්න, පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

එක්තරා කල්පිත ග්‍රහලෝකයකට එක් සූර්යයෙක් ද ඉදිබුචන්ද්‍ර සහ අශ්වචන්ද්‍ර යනුවෙන් හැඳින්වෙන හඳවල් දෙකක් ද පායයි. සිය සූර්යයා වටා යන්නට මෙම ග්‍රහලෝකය හරියටම දින 200 ක් ගන්නා අතර ග්‍රහලෝකය වටා යන්නට, ඉදිබුචන්ද්‍රයා දින 30 ක් ද අශ්වචන්ද්‍රයා දින 12 ක් ද ගනී. පුරහඳ දෙකක් එකවර අහසේ පැයූ විට මහාචන්ද්‍ර රාත්‍රියක් ලෙස ද, එක් පුරහඳක් පැයූ විට චූලචන්ද්‍ර රාත්‍රියක් ලෙස ද එම ග්‍රහලෝක වැසියෝ හඳුන්වති.

**22.** මහාචන්ද්‍ර රාත්‍රී දෙකක් අතර චූලචන්ද්‍ර රාත්‍රී කීයක් තිබේ ද?
(1) 2 (2) 3 (3) 4 (4) 5 (5) 6

**23.** පසුගිය අවුරුද්දේ මහාචන්ද්‍ර රාත්‍රී හතරක් පැවතියේ නම්, මෙම අවුරුද්දේ එවැනි රාත්‍රී කීයක් තිබිය හැකි ද?
(1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5

[හතරවැනි පිටුව බලන්න.

**24.** මෙම ග්‍රහලෝකය අරඹයා පහත කුමන ප්‍රකාශය **අසත්‍ය** වේද?
(1) පූර්ණ අමාවක රාත්‍රියක් කිසිදා ඇති නොවේ.
(2) අශ්වචන්ද්‍රයා අමාවක වූ චූලචන්ද්‍ර රාත්‍රියක් ඇත.
(3) හරි අඩසඳ දෙකක් පැයූ රාත්‍රියක් කිසිදා ඇති නොවේ.
(4) ඉදිබුචන්ද්‍රයා හරි අඩසඳක් ව පැයූ, අශ්වචන්ද්‍රයා අමාවක වූ රාත්‍රියක් ඇත.
(5) අශ්වචන්ද්‍රයා හරි අඩසඳක් ව පැයූ, ඉදිබුචන්ද්‍රයා අමාවක වූ රාත්‍රියක් ඇත.

- අංක **25** සිට **27** තෙක් ප්‍රශ්න, පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

බාර්බිලෝනියාව නම් කල්පිත ශිෂ්ටාචාරයේ වැසියන්ට ඔවුන්ගේම සංඛ්‍යා මාලාවක් තිබූ අතර, එකතු කිරීම සහ ගුණ කිරීම සඳහා ඔවුන් භාවිත කළ සංකේත පිළිවෙළින්  සහ  වේ. බාර්බිලෝනියානුවන් විසින් විවිධ සංඛ්‍යා ($n$) සහ ඒවා තුනේ බලවලට නැඟූ විට ලැබෙන සංඛ්‍යා ($3^n$) ඇතුළත් කොට සාදනු ලැබූ පුවරුවක් පහත දැක්වේ.

| $n$ | @ | # | @  # | @  $ | @  @  $ | @  #  $ |
|---|---|---|---|---|---|---|
| $3^n$ | % | ^ | & | * | * | { |

**25.** බාර්බිලෝනියානුවන් % මගින් සංකේත කළ සංඛ්‍යාව කුමක් ද?
(1) 0 (2) 1 (3) 3 (4) 9 (5) 27

**26.** එකම සංඛ්‍යාව නිරූපණය කරන සංකේත දෙකක් වන්නේ මොනවා ද?
(1) % සහ $ (2) & සහ * (3) $ සහ * (4) { සහ % (5) ^ සහ &

**27.** බාර්බිලෝනියානු සංකේතවලින් ^  * සමාන වන්නේ මින් කුමකට ද?
(1) { (2) & (3) %  * (4) ^  { (5) &  %

**28.** එක්තරා සම්මත දාදුකැටයක මුහුණත්වල ඇති තිත් රටා පහත රූප මගින් විස්තර කෙරේ:





දකුණත පැත්තේ ඇති රූපය මගින් එවැනි දාදු කැට හතරක ඇසුරුමක්, සමහර මුහුණත්වල තිත් රටා නිරූපණය නොකර දැක්වේ. එකිනෙක ස්පර්ශවන සෑම මුහුණත් දෙකකම එකම තිත් සංඛ්‍යාවක් ඇත. ඒ අනුව දාදුකැට ඇසුරුමෙහි දකුණත් පැති පෙනුම දැක්වෙන්නේ පහත දැක්වෙන කවර රූපය මගින් ද?



(1) (2) (3) (4) (5)

- අංක **29** සිට **31** තෙක් ප්‍රශ්න, පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

උද්‍යානයක පදිකයන් සඳහා ම නිමැවූ සරල රේඛීය ගමන් පෙතක් ද, පාපැදිකරුවන් සඳහා, එම සරල රේඛීය පෙත විෂ්කම්භය කොටගත් වෘත්තාකාර පෙතක් ද ඇත. ශරීර ව්‍යායාම පිණිස එහි පැමිණි පාපැදිකරුවෙක් සහ පදිකයෙක් එකම මොහොතේ, එකම තැනින් ගමන් අරඹා, ඒකාකාර වේගයෙන් ස්වකීය පථවල ගමනෙහි යෙදෙති. පදිකයා එක් වරක් පෙතෙහි ඉදිරියට ඇවිද ගොස් නැවත තමා පටන් ගත් තැනට පැමිණි විට, පාපැදිකරු වට දෙකහමාරක් ගොස් සිටියේ ය.

**29.** පදිකයා පෙතෙහි අඩක් ඇවිද ගිය විට පාපැදිකරු වට කොපමණ පැද ගොස් තිබේ ද?
(1) 5/8 (2) 2/3 (3) 5/6 (4) 9/7 (5) 4

**30.** ඔවුන් දෙදෙනා පළමුවරට එකිනෙකා හමුවන විට පදිකයා රේඛීය ගමන් පෙතෙහි දුර කී වතාවක් ඇවිද ගොස් තිබේ ද?
(1) 2 (2) 3 (3) 4 (4) 5 (5) 6

**31.** ගමන් පටන් ගත් පසු, එකිනෙකා පළමුවරට හමුවන්නට පෙර කී වතාවක් ඔවුන් දෙදෙනා අතර දුර රේඛීය පෙතෙහි මුළු දුරට සම වේ ද?
(1) 0 (2) 1 (3) 2 (4) 3 (5) 4

- අංක **32** සිට **35** තෙක් ප්‍රශ්න, පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

කලකට පසු සංගීත ප්‍රසංගයකදී මුණගැසුණු තිලකා, සුමනා, ශීලා සහ මැණිකා යන පැරණි මිතුරියන් හතරදෙනා අතර සංවාදයක් ඇති වූයේ පහත අයුරිනි.

තිලකා : සුමනා, ඔයා ඉතින් මට අක්ක කෙනෙක් නෙ.
සුමනා : මොනවද මෙ කියන්නේ තිලකා, ඔයයි ශීලයි දෙන්නම මට වඩා වැඩිමල්.
ශීලා : මෙ මේ මට වඩා බාල කෙනෙක් මෙතැන ඉන්නේ මැණිකා විතරයි.
මැණිකා : සහතිකයි, මෙතැන මට වඩා බාල එක්කෙනයි ඉන්නේ.

**32.** මෙහි සත්‍ය ප්‍රකාශ කළ හැකි අය උපරිම වශයෙන් කී දෙනෙක් ද?
(1) 0 (2) 1 (3) 2 (4) 3 (5) 4

**33.** සුමනා සහ මැණිකා සත්‍ය ප්‍රකාශ කරත් නම්, ලාබාල ම මිතුරිය කවුරුන් ද?
(1) මැණිකා (2) තිලකා (3) ශීලා
(4) සුමනා (5) නිර්ණය කිරීමට දත්ත ප්‍රමාණවත් නොවේ.

**34.** තිලකා සහ මැණිකා සත්‍ය ප්‍රකාශ කරත් නම්, කිසිසේත් සම වයසේ විය **නොහැකි** වන්නේ කිනම් යුගලය ද?
(1) තිලකා සහ ශීලා (2) තිලකා සහ මැණිකා
(3) සුමනා සහ ශීලා (4) මැණිකා සහ ශීලා
(5) මැණිකා සහ සුමනා

**35.** තිලකා සහ ශීලා සත්‍ය ප්‍රකාශ කරත් නම්, සම වයසේ සිටිය හැක්කේ කවුරුන් ද?
(1) තිලකා සහ ශීලා පමණි. (2) මැණිකා සහ සුමනා පමණි.
(3) තිලකා සහ සුමනා පමණි. (4) මැණිකා, සුමනා සහ ශීලා පමණි.
(5) ශීලා, තිලකා සහ මැණිකා පමණි.

**36.** පහත අවස්ථා නිශ්චිතව සිදුවන (A) ද, සිදුවීමේ ඉඩ බෙහෙවින් වැඩි (B) ද, සිදුවීමට ඉඩ ඇති (C) ද, සිදුවීමට අපහසු (D) සහ කිසිසේත් සිදුවීමට නොහැකි (E) ලෙස අනුපිළිවෙළින් වර්ග කර ඇති වරණය තෝරන්න.

* එකම බොලිවුඩ් නළුවා ප්‍රිය කරන ක්‍රීඩිකාවෝ දෙදෙනෙක් ඉන්දියානු දැල්පන්දු කණ්ඩායමේ සිටිති.
* එකම කෙස් ගණන හිසේ ඇති ක්‍රීඩකයෝ දෙදෙනෙක් උස්බෙකිස්තාන පාපන්දු කණ්ඩායමේ සිටිති.
* එකම පළාතෙන් පැමිණි ක්‍රීඩකයෝ දෙදෙනෙක් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ සිටිති.
* එකම විදේශ ගමන් බලපත්‍ර අංකය ඇති ක්‍රීඩකයෝ දෙදෙනෙක් රුමේනියානු පැසිපන්දු කණ්ඩායමේ සිටිති.
* එකම රූපවාහිනී වැඩසටහන නරඹන ක්‍රීඩිකාවෝ දෙදෙනෙක් රුසියානු කාන්තා අත්පන්දු කණ්ඩායමේ සිටිති.

(1) *A, D, B, E, C* (2) *B, A, C, D, E* (3) *B, A, D, E, C* (4) *B, D, A, E, C* (5) *C, B, D, A, C*

- අංක **37** සිට **39** දක්වා ප්‍රශ්න පහත විස්තරය මත පදනම් වේ.

A, B, C, D, E සහ F යන මිතුරු මිතුරියන් හයදෙනා, ෂඩස්‍ර මේසයක් වටා එහි කේන්ද්‍රය දෙසට මුහුණ ලා වාඩිවී සිටිති. ඔවුන් අතුරෙන් A, E සහ F පිරිමි ළමයින් වන අතර, B, C හා D ගැහැනු ළමයි වෙති. ඔවුන් වාඩි වී සිටින්නේ පහත දැක්වෙන පරිදි වේ.

* E මුහුණ ලා සිටින්නේ C ට ය.
* B අසලින්ම දෙපසින් වාඩිවී සිටින්නේ E හා F ය.
* සෑම පිරිමි ළමයකුම ගැහැනු ළමයකුට මුහුණ ලා වාඩිවී සිටී.

**37.** A ට නිශ්චිතවම ආසනයක් වෙන් කර ඇත්නම් එවිට අනෙක් මිතුරන්ට මේසය වටා වාඩිවීමට එකිනෙකට වෙනස් ආකාර කීයක් තිබේ ද?
(1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5

**38.** පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් කවරක් නිවැරදි වේද?
(1) A ට මුහුණ ලා සිටින්නේ B ය. (2) A ට මුහුණ ලා සිටින්නේ C ය.
(3) A ට මුහුණ ලා සිටින්නේ D ය. (4) B ට මුහුණ ලා සිටින්නේ E ය.
(5) B ට මුහුණ ලා සිටින්නේ F ය.

**39.** මිතුරන් හයදෙනා වාඩි වී සිටින චක්‍රයෙහි නිවැරදි පටිපාටිය දෙනු ලබන්නේ පහත දැක්වෙන කවරක් මගින් ද?
(1) A, B, E, C, F, D (2) A, B, E, F, C, D (3) A, C, E, F, B, D (4) A, C, F, E, B, D (5) A, D, E, B, F, C

**40.** සිරස්ව සවිකර ඇති තල දර්පණයක් ඉදිරියෙහි රූපයෙහි දැක්වෙන පරිදි මිනිසෙක් සිටගෙන සිටියි. මිනිසාගේ උස $h$ යැයි ගනිමු. මිනිසාට දර්පණය තුළින් තමාගේ මුළු ප්‍රතිබිම්බයම දැකගත හැකිවීම සඳහා දර්පණයෙහි තිබිය යුතු අවම දිග $l$ යැයි ගනිමු. එවිට පහත දැක්වෙන කවර සම්බන්ධතාව නිවැරදි වේ ද?



(1) $l > h$ (2) $l = h$ (3) $h > l > h/2$
(4) $l = h/2$ (5) $h/2 > l$

● අංක **41** සහ **42** ප්‍රශ්න, පහත දැක්වෙන වෘත්ත ප්‍රස්තාරවල නිරූපණය කෙරෙන තොරතුරු මත පදනම් වේ.




රූපය 01 : A, B, C, D, E මධ්‍යස්ථාන පහේදී තෝරාගැනීමේ පරීක්ෂණයට **පෙනිසිටි** අයදුම්කරුවන් සංඛ්‍යාව




රූපය 02 : A, B, C, D, E මධ්‍යස්ථාන අනුව පරීක්ෂණය **සමත්** අයදුම්කරුවන් සංඛ්‍යාව

**41.** A, B, C, D, E මධ්‍යස්ථාන පහේදී පරීක්ෂණයට පෙනී සිටි මුළු අයදුම්කරුවන් සංඛ්‍යාව 1000 ක් නම්, A මධ්‍යස්ථානයේ දී පරීක්ෂණයට පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව කීය ද?

(1) 72 (2) 90 (3) 100 (4) 108 (5) 120

**42.** A මධ්‍යස්ථානයේදී පරීක්ෂණයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් පරීක්ෂණය සමත් වූවෝ නම්, පරීක්ෂණයට පෙනී සිටි මුළු අයදුම්කරුවන්ගෙන් කවර ප්‍රතිශතයක් පරීක්ෂණය සමත් වී තිබේ ද?

(1) 72% (2) 80% (3) 81% (4) 90% (5) 100%

● අංක **43** සහ **44** ප්‍රශ්න, පහත දැක්වෙන තොරතුරු සහ වෙන් රූපය මත පදනම් වේ.

එක්තරා පාසලක උසස් පෙළ විද්‍යා විෂය ධාරාව හදාරන සිසු කාණ්ඩ තුනක් සිටිති. එනම්,

1. සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව හදාරන සිසුන් (භෞතීය විද්‍යා විෂය ධාරාව)
2. ජීව විද්‍යාව, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව හදාරන සිසුන් (ජෛවීය විද්‍යා විෂය ධාරාව)
3. ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව හා රසායන විද්‍යාව හදාරන සිසුන් (කෘෂි විද්‍යා විෂය ධාරාව)

භෞතික විද්‍යාව හදාරන සිසුන් →




← ජීව විද්‍යාව හදාරන සිසුන්

අ.පො.ස. උසස් පෙළ විද්‍යා විෂය ධාරාව හදාරන සිසුන්

**43.** සිසුහු කී දෙනෙක් භෞතීය විද්‍යාව විෂය ධාරාව හදාරත් ද?

(1) 40 (2) 60 (3) 80 (4) 100 (5) 120

**44.** සිසුහු කී දෙනෙක් රසායන විද්‍යාව විෂයය හදාරත් ද?

(1) 120 (2) 140 (3) 180 (4) 200 (5) 260

**45.** මෙම ප්‍රශ්නයෙහි 1 සහ 7 මගින් අංකනය කර ඇති වාක්‍ය දෙක අතර ඇති *A, B, C, D, E* වාක්‍ය ඒවායෙහි නියමිත පටිපාටියෙහි **නොමැත**. වාක්‍ය හතෙහි තාර්කික අනුක්‍රමයක් සැකසීම සඳහා ඒවායෙහි නිවැරදි පිළිවෙළ කිරීම තෝරන්න.

1 – ශුභ නැකැත් වේලාවකට අනුව හිසතෙල් ගෑම හා අනතුරුව ස්නානය කිරීම නව අවුරුදු සැමරීමේදී වැදගත් අංගයක් ලෙස සැලකේ.

*A* – කණාමුට්ටිය බිඳීම නව අවුරුදු සැමරීමේදී සිදු කරනු ලබන විචිත්‍රවත් අංගයකි.

*B* – ආගමික සිද්ධස්ථානයකට යාම වඩා වැදගත් අංගයකි.

*C* – දවසේ වැඩසටහන නිමාවේදී ප්‍රධාන ආරාධිත අමුත්තාගේ කතාව හා ත්‍යාග ප්‍රදානය සිදුකරනු ලබයි.

*D* – සියලු දෙනාම ආගමික ස්ථානයට ගොස් ආශිර්වාද ලබා ගනිති.

*E* – දවසේ අවසාන ක්‍රීඩාව වශයෙන් පැවැත්වෙන අවිවාහක හා විවාහක කාන්තාවන් අතර කඹ ඇදීමේ තරගය ඉතාමත් විනෝදජනක අවස්ථාවකි.

7 – නව අවුරුදු උත්සව රාත්‍රියේ පැවැත්වෙන වැඩසටහන සාමාන්‍යයෙන් ගමේ දරුවන් විසින් සිදු කරන පිළිගැනීමේ නර්තනයකින් ආරම්භ වේ.

(1) *B, D, A, E, C* (2) *B, D, E, A, C* (3) *B, E, A, D, C* (4) *D, B, A, E, C* (5) *D, B, E, A, C*

PAST PAPERS WIKI

**46.** පහත දැක්වෙන සෑම *A*, *B*, *C*, *D* සහ *E* කොටසක් ම ප්‍රකාශ තුනකින් සමන්විත වේ.
අර්ථාන්විත අනුක්‍රමයක පෙළගැස්විය හැක්කේ ඒවායින් කුමන කොටසක අඩංගු ප්‍රකාශ තුන ද?

*A* (*a*) රජයේ වී බීජ පර්යේෂණ මධ්‍යස්ථානය කුරුණෑගල බතලගොඩ පිහිටා ඇත.
(*b*) සාම්ප්‍රදායික වී ප්‍රභේදවල අස්වනු නෙළීමට මාස 4 ක පමණ කාලයක් ගත වේ.
(*c*) බතලගොඩ අභිජනනය කරන BG 300 ප්‍රභේදයේ අස්වනු නෙළීමට මාස 3 ක පමණ කාලයක් ගත වේ.

*B* (*a*) අධ්‍යාපනය වනාහි මූලික අවශ්‍යතාවක් පමණක් නොවන අතර එය පුද්ගල අයිතියකි.
(*b*) පාසල් අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණු අතරට (i) මනා චරිතවත් පුද්ගලයකු බිහිකිරීම (ii) ශක්තිමත් පෞරුෂයක් ගොඩනැගීම (iii) අනාගත රැකියා වෙළඳපොළට වෘත්තිකයන් සූදානම් කරවීම යනාදිය ඇතුළත් ය.
(*c*) පාසල් අධ්‍යාපනයේ හදවත වන්නේ ගුරුභවතුන් ය.

*C* (*a*) විදුලි විසන්ධිවීමක් පිළිබඳව නිවාස හිමියා විසින් දූරකථන මාර්ගයෙන් විදුලිබල මණ්ඩලය දැනුවත් කිරීම.
(*b*) රාත්‍රී 9.00 ට පමණ නිවසේ විදුලිය විසන්ධි වීම.
(*c*) දිවයින පුරා විදුලිය විසන්ධි වීමක් සිදුවී ඇති බවත්, අද දින රාත්‍රී 10.00 වන විට එය නැවත යථා තත්වයට ගෙන එන බවත් විදුලිබල මණ්ඩල නිලධාරියකු විසින් දැනුවත් කිරීම.

*D* (*a*) අපේක්ෂිත බරට ළඟාවීමට බ්‍රොයිලර් වර්ගයේ කුකුළකුට මාස 2 ක පමණ කාලයක් ගත වේ.
(*b*) මව් කිකිළියකගෙන් හෝ රක්කුම් යන්ත්‍රයකින් බිත්තර රැකීම සඳහා ගන්නා කාලය සති 3 ක් වේ.
(*c*) කිකිළියක් බිත්තර දැමීම ආරම්භ කිරීමට ගන්නා කාලය මාස $3\frac{1}{2}$ පමණ වේ.

*E* (*a*) සුලභව පරිභෝජනය කෙරෙන පලතුරු වර්ග තුන කෙසෙල්, අඹ හා වරකා වේ.
(*b*) ශ්‍රී ලංකාවේ සාමාන්‍යයෙන් පරිභෝජනය කරන ආහාරවේලක් වන්නේ බත් සහ ව්‍යංජන ය.
(*c*) ප්‍රෝටීන් ප්‍රභව දෙකක් ලෙස බිත්තර සහ කිරි සාමාන්‍යයෙන් නිර්දේශ කර ඇත.

(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) *E*

**47.** පහත රූපවලින් විස්තර වන සිදුවීම් සලකා බලන්න.



*A*



*B*



*C*



*D*



*E*



*F*

පින්තූරවල පහත දැක්වෙන කවර පෙළගැස්වීම සිදුවීම්වල නිවැරදි අනුපිළිවෙළ ලබා දෙයි ද?

(1) *B*, *A*, *D*, *E*, *C*, *F*
(2) *B*, *A*, *D*, *E*, *F*, *C*
(3) *B*, *E*, *D*, *A*, *C*, *F*
(4) *B*, *E*, *D*, *A*, *F*, *C*
(5) *E*, *D*, *A*, *B*, *C*, *F*

[අවසානී පිටුව බලන්න.

Past Papers Wiki

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- අංක **48** සිට **50** තෙක් ප්‍රශ්න, පවුලක සාමාජිකයින් වන සිරිල් නම් වූ පියා, කමලා නම් වූ මව, ඔවුන්ගේ දියණිය වන සමලිගේ උපාධි ප්‍රදානෝත්සවයට සහභාගි වීම පිළිබඳව සිදුවූ සංවාදය මත පදනම් වේ. සමලිගේ මිතුරියක් වන අනූෂා ද ඔවුන්ගේ උපාධි ප්‍රදානෝත්සව ගමන හා සම්බන්ධ වෙයි. ඔවුන් අතර සිදුවන මෙම සංවාදය *A* සිට *M* තෙක් කොටස්වලින් සමන්විත වන නමුත් ඒවා සංවාදය සිදුවූ අනුපිළිවෙළ අනුව ඉදිරිපත් කර **නොමැත**.

*A* : තාත්තේ, මට ඇහුණා, තාත්තාගේ සංවාදය වෑන් එකක් කුලියට ගැනීම ගැන. නමුත් මගේ කණ්ඩායමේ යාළුවෝ කිහිපදෙනෙක් වාහනයක් කුලියට ගන්න තීරණය කළා. එහෙම වුනාට තාත්තාගේ සැලසුම කරගෙන යන්න.

*B* : අපිත් එක්ක උපාධි ප්‍රදානෝත්සවයට යන ගමනට ඔයාව සාදරයෙන් පිළිගන්නවා.

*C* : මාමේ, නැන්දේ ඔයාලත් එක්ක මට මෙ උත්සවයට සහභාගීවීමට ලැබීම හරිම සතුටක්.

*D* : ඔව් කමලා, දහදෙනකු විතර අපිත් එක්ක වාහනයේ යන්න ඒවි.

*E* : සිරිල්, අපට දුවගේ උපාධි උත්සවයට යන්න වෑන් එකක් කුලියට ගන්න වෙයි.

*F* : මමත් සමූහ ඡායාරූපයට සම්බන්ධ වෙන්න ද?

*G* : බලන්න පෙරහැර, කොච්චර ආඩම්බරයක් ද අපේ සමලි දැකීම.

*H* : උත්සවය ඉවර වුනාම අපි තනි හා කණ්ඩායම් ඡායාරූප ටිකක් ගනිමු.

*I* : සිරිල්, වාහනේ යන අය ගැන අදහසක් ගන්න කෝකටත් සමලි එක්කත් කතා කරන එක හොඳයි.

*J* : සිරිල්, අනූෂා අපිත් එක්ක උත්සවයට යන්න කැමැත්තෙන් ඉන්නේ. වාහනේ ඉඩ තියෙනවා නම්, අපි එයාවත් එක්කගෙන යමු.

*K* : ඔව්, ඒක හරිම විචිත්‍රවත් වේවි.

*L* : ඔව්, කමලා, මම එයාට කථා කරන්නම්.

*M* : කමලා, අපේ දුව එයාගේ කණ්ඩායමේ අයත් එක්ක වෙනම ගමන යාවි, අපි වෙනම යමු.

**48.** මව සහ පියා අතර සංවාදය නිවැරදි අනුපිළිවෙළින් දැක්වෙන්නේ පහත කවර වරණය මගින් ද?

(1) *E, D, I, L, M, J*
(2) *E, D, M, J, I, L*
(3) *E, D, M, J, L, I*
(4) *I, L, E, D, J, M*
(5) *I, L, E, D, M, J*

**49.** අනූෂා සහ සිරිල් අතර සංවාදය නිවැරදි අනුපිළිවෙළින් දැක්වෙන්නේ පහත කවර වරණය මගින් ද?

(1) *C, B, F, K, G, H*
(2) *C, B, G, H, F, K*
(3) *F, K, G, H, C, B*
(4) *G, H, C, B, F, K*
(5) *G, H, F, K, C, B*

**50.** සමස්ත සංවාදයේ තර්කානුකූල අනුක්‍රමය ලබාදෙන්නේ පහත කුමන වරණය මගින් ද?

(1) *E, D, I, L, A, M, J, C, B, G, H, F, K*
(2) *E, D, I, L, A, M, J, G, H, F, K, C, B*
(3) *E, D, M, J, I, L, A, C, B, F, K, G, H*
(4) *E, D, M, J, I, L, A, G, H, F, K, C, B*
(5) *I, E, D, L, M, J, A, C, B, F, K, G, H*

***

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library